# ශ්‍රී ලංකාවේ ජනගහනය ආර්ථික වර්ධනය කෙරෙහි සිදු කරන බලපෑම

බී.ජී.ටී හර්ෂණී අමරකෝන්[1]

***අභිමතාර්ථය 08:*** තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායී රැකියා සහ සියලු දෙනාටම යහපත් රැකියාවක් ප්‍රවර්ධනය කිරීම

## 1. හැඳින්වීම

ජනගහන වර්ධනය සහ ආර්ථික වර්ධනය අතර ක්‍රියාකාරීත්වය සැලකීමේදී ජනගහන වර්ධනය හා සම්බන්ධ විවිධ ගැටලු හේතුවෙන් ජනගහන වර්ධනය ආර්ථිකයකට අහිතකර ලෙස බලපාන බව ඇතැම් ආර්ථික විද්‍යාඥයින් විසින් ප්‍රකාශ කර ඇති අතර සමහරු තර්ක කළේ ජනගහන වර්ධනය, ආර්ථික වර්ධනය හා සංවර්ධනය උත්තේජනය කිරීමෙන් ආර්ථිකය ඉහළ නංවන බවයි. ජනගහන න්‍යායන් ප්‍රධාන වශයෙන් යුග තුනකට වර්ග කළ හැකිය. එම න්‍යායන් නම් පූර්ව-මැල්තුසියානු න්‍යායන්, මැල්තුසියානු න්‍යායන් සහ පශ්චාත් මැල්තුසියානු න්‍යායන් ය. මූලික වශයෙන් මෙම යුගයේ සමහරු ආර්ථික වර්ධනය සඳහා ජනගහනය වර්ධනය සාධකයක් යැයි තර්ක කළ අතර සමහරු ජනගහන වර්ධනය ආර්ථික සංවර්ධනයට බාධාවක් ලෙස ඉදිරිපත් කළහ (ගුණරත්න, 2007). මෙම චින්තන විද්‍යාවේ ප්‍රධාන තර්කය නම් වැඩිවන ජනගහනය ආර්ථිකයට සම්පත් ඉල්ලුමේ වැඩිවීම හේතුවෙන් ආර්ථිකයට අහිතකර ලෙස බලපානු ඇති බවයි (කුමාරසිංහ සහ වික්‍රමසිංහ, 2018).

මෙරට තුළ ක්‍රම ක්‍රමයෙන් ජනගහනය වර්ධනය වීමත් සමග අද වන විට සෑම ක්ෂේත්‍රයකම විවිධ ගැටලු පැනනැගී ඇති බව දක්නට ලැබේ. ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස එවැනි වෙනස්කම්වලට මුහුණ දීමට සිදු වේ. ශ්‍රී ලංකාවේ ජනගහනය එහි ප්‍රමාණය, සංයුතිය සහ ව්‍යුහය තියුණු වෙනසකට ලක්වන බව පැහැදිලිය (Statista, n.d.).

අධික ජන ප්‍රසාරණය රටක ආර්ථික සංවර්ධනයට බාධාවක් නම් ජනගහන පාලන ක්‍රමවේද අනුගමනය කළ යුතුවේ. ආර්ථික සංවර්ධනයට හිතකර ජනගහන වර්ධනයක් රට තුළ පවතින්නේ නම් විධිමත් ලෙස මානව ප්‍රාග්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍ය, පෝෂණ ක්ෂේත්‍රවලින් ශක්තිමත් කළ යුතුවේ. සීඝ්‍ර ජන සංඛ්‍යා ප්‍රසාරණය ආර්ථිකයට බරක් නොවේ නම් එම රටවල ජන සංඛ්‍යා වර්ධනයට වඩා ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතයක් ළඟාකර ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් ජනගහන වර්ධනය තුළින් ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කරගත හැක.

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
harshanithilona@gmail.com

## 2. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය සහ ආර්ථික වර්ධනය අතර ඇති සම්බන්ධතාව මෙන්ම ආර්ථික වර්ධනයට සිදුවන බලපෑම අධ්‍යයනය කිරීමය. ඊට අමතරව ජනගහන වර්ධනයත් සමග ඇතිවන වෙනස්කම් හදුනා ගැනීමත්, ඒ තුළින් යහපත් මෙන්ම අයහපත් පැතිකඩ හඳුනාගැනීමත් මෙම අධ්‍යයනයේ සෙසු අරමුණු වේ.


ඒ අනුව මෙම පර්යේෂණය සඳහා දත්ත යොදා ගනු ලබන්නේ 2005 සිට 2020 ජනගහන වර්ධනයට අදාළ වන ක්ෂේත්‍රයන් ගණනය කිරීම් මගිනි. මෙම පර්යේෂණය පූර්ණ වශයෙන් ද්විතියික දත්ත පදනම් කර ගනිමින් සිදු කරනු ලැබේ. ඒ අනුව පර්යේෂණයට යෝග්‍ය පරිදි සංඛ්‍යාත්මක දත්ත තුළින් ප්‍රමාණාත්මක අධ්‍යයනයක් සිදු කරනු ලබයි.

මෙම පර්යේෂණයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමය, සහසම්බන්ධතා විශ්ලේෂණය, බහුගුණ ප්‍රතිපායන විශ්ලේෂණය යන විශ්ලේෂණ ක්‍රම දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගෙන ඇත. ප්‍රධාන වශයෙන් දත්ත විශ්ලේෂණ මෙවලම ලෙස SPSS හා Excel මෘදුකාංගය යොදාගනු ලැබේ.

## 3. දත්ත විශ්ලේෂණය

ජන හා සංඛ්‍යා ලේඛන වාර්තාවලට අනුව 1871 වසරේ පැවැති ප්‍රථම ජන සංගණනයේ දී දිවයිනේ මුළු ජනගහනය 2,400,380ක් වූ අතර, එතැන් සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ජනගහනය නොකඩවා වර්ධනය වෙමින් පවතී. ප්‍රථම ජන සංගණනයෙන් වසර සියයකට පසුව පැවැති 1971 ජන සංගණනෙය් දී ජනගහනය 12,689,897ක් වූ අතර, ඉන් තවත් හතලිස් වසරකට පසුව පවත්වන ලද 2012 ජන සංගණනෙය් දී දිවයිනේ මුළු ජනගහනය 2,277,597ක් විය. ජනගහනය ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර 2005 සිට 2020 දක්වා එහි හැසිරීම පහත රූප සටහනෙන් දැක්වේ.

ප්‍රස්තාර සටහන 1: සමස්ත ජනගහන වර්ධනය (2005-2020)




*මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා, 2000 - 2020*

ප්‍රස්තාර සටහන 1ට අනුව 2005 සිට අඛණ්ඩව ජනගහනය වැඩි වී ඇති අතර 2012 වර්ෂයේ දී යම් අඩුවීමක් දක්නට ලැබේ. එම වර්ෂයේ දී ජනගහන වර්ධනය සැලකිය යුතු ලෙස පහත වැටීමකට ලක්වී තිබෙන බව පැහැදිලි වේ. මෙයට හේතු වී ඇත්තේ රටෙහි උපත් අනුපාතිකය පහත වැටීමයි. නැවන 2020 වන විට ජනගහයේ වර්ධනයක් දැකගත හැකිය.

ශ්‍රම බලකාය හෙවත් ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය යනු රැකියා අවස්ථා පිළිබඳ සලකනු ලබන වඩා පුළුල් වූ මිනුමකි. ජනගහනය කාලීන වූ රැකියා නියුක්ති හා වියුක්ති තත්ත්වයන් මෙන්ම කාලීන රැකියා තත්වයන් මෙන්ම කාලීන රැකියාවන් හි ලක්ෂණයන් හඳුනා ගැනීමට මෙය භාවිතා කරනු ලබයි.

වගු අංක 1: පුම්තිරිභාවය අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සහභාගීත්ව අනුපාතය 2005 - 2020

| වර්ෂය | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|
| 2005 | 30.9 | 67.1 |
| 2010 | 31.2 | 67.1 |
| 2012 | 33.5 | 72.3 |
| 2015 | 35.9 | 74.7 |
| 2017 | 36.6 | 74.5 |
| 2020 | 38.2 | 75.6 |

*මූලාශයඃ ශ්‍රමබල සමීක්ෂණ වාර්තාව, 2005 - 2020*

ඉහත වගුවට අනුව වාර්ෂිකව සැසඳීමේදී පෙනී යන කරුණක් වන්නේ සෑම වර්ෂයකදීම ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතයේ ඉහළ අගයක් ගෙන ඇත්තේ පුරුෂ පක්ෂය බවත් සහ ඊට සාපේක්ෂව කාන්තා පක්ෂය ඉතා අඩු අනුපාතයකින් යුක්ත වී ඇති බවයි.

මෙම අධ්‍යයනයේ දී ආර්ථික වර්ධනයට ජනගහන වර්ධනය නිසා ඇතිවන යම් යම් හේතු කාරණා වන ශ්‍රම බලකායේ ප්‍රවණතා, ජනගහන වයස්ගතවීම, මරණ අනුපාතය, සංක්‍රමණික ප්‍රවණතා, ජීවිත අපේක්ෂාව යන හේතූන් අතර සහසම්බන්ධතා විශ්ලේෂණයක් සිදුකර ඇත. මෙම විචල්‍ය අතර සම්බන්ධතාව මැනීමේදී කාල් පියර්සන්ගේ සහසම්බන්ධතා සංගුණකය යොදාගන්නා අතර එම සහසම්බන්ධතාවයන්ගේ ප්‍රමාණයන් පිළිබඳව ද දක්වා ඇත. එමෙන්ම මේ සඳහා ආර්ථික වර්ධනය මැනීමට යොදා ගන්නා මිනුමක් ලෙස දළ දේශීය නිශ්පාදිතය සලකා බලනු ලැබේ.

වගු අංක 2න් දැක්වෙන්නේ එක් එක් විචල්‍යයන් අතර පවතින සහසම්බන්ධතා අගයන් සහ එහි වෙසෙසියාව පිළිබඳවයි. ඒ අනුව ජනගහනය සහ දළ දේශීය නිශ්පාදිතය අතර සම්බන්ධයක් පවතියිද යන්න පරීක්ෂා කිරීම සඳහා 1% වෙසෙසියා මට්ටම යටතේ කාල් පියර්සන්ගේ සහසම්බන්ධතා විශ්ලේෂණයක් සිදුකර ඇත. ගණනය කළ අගය $p = 0.000$ වේ. මෙම $p = 0.000 < 0.01$ වන හෙයින් 1% වෙසෙසියා මට්ටම යටතේ

ජනගහනය සහ දළ දේශීය නිශ්පාදිතය අතර ප්‍රබල ධන සම්බන්ධතාවක් පවතින බව තහවුරු වේ. ඒ අනුව දළ දේශිය නිශ්පාදිතය සමග සළකා බැලෙන අනෙකුත් සෑම විචල්‍යයක් අතරම ධන සම්බන්ධතාවක් පවතී.

වගු අංක 2: දළ දේශීය නිශ්පාදිතය සහ ජනගහනය අතර සහසම්බන්ධතා විශ්ලේෂණය

| | ද.දේ.නි | ජනගහනය | ශ්‍රම බලකාය | ජනගහන වයස්ගතවීම | මරණ අනුපාතය | සංක්‍රමණ | ජීවන අපේක්ෂාව |
|---|---|---|---|---|---|---|---|
| ද.දේ.නි | - | 0.955 (.000) | 0.758 (.001) | 0.977 (.000) | 0.675 (.004) | 0.914 (.000) | 0.994 (.000) |

*මූලාශ්‍රයඃ කතෘගේ ගණනය කිරීම්, 2022*

**4. නිගමන හා යෝජනා**

දත්ත විශ්ලේෂණයේ දී ජනගහන වර්ධනය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ධනාත්මක සහ සැලකිය යුතු ලෙස බලපෑම් කරන බව සොයාගෙන ඇත. නමුත් ඇතැම් වර්ෂවලදී ජනගහන වර්ධනය ඊට ආසන්න වර්ෂයට වඩා සාපේක්ෂව අඩු වුවද දළ දේශීය නිශ්පාදිතයෙහි වැඩී වී ඇත. ඒ අනුව ජනගහන වර්ධනය ආර්ථිකයට සෘජුවම බලපෑම් නොකරන බවත් ඒ සඳහා වෙනත් සාධක ඇති බව හඳුනාගත හැකිය.

ජනගහනය හේතුවෙන් ශ්‍රමිකයින් සංඛ්‍යාව ඉහළ යන අතර එය රටේ ආර්ථිකයට ධනාත්මක ලෙස බලපායි. මේ අනුව දිවයිනේ සමස්ත ජනගහනයෙන් තවත් අර්ධයක් පමණ ආර්ථික වශයෙන් සක්‍රීය නොවන තත්වයක් පෙන්නුම් කරයි. රැකියා ප්‍රශ්නයට මුහුණදීමට සිදුවීම, ජීවන තත්වය පහළ යාම වැනි ආර්ථික ප්‍රශ්න, මානසික අසහනතා ඇති වීම, සමාජ විරෝධී ක්‍රියා උග්‍රවීම, කැරලි යනාදී දේශපාලන ප්‍රශ්නත් ශ්‍රම සේවා වියුක්තිය නිසා ඇතිවේ. ආර්ථික කටයුතුවල නියුතු ජනගහනය අතරින් බහුතරයක් පුරුෂයින් වේ.

ජනගහනය වියපත්වීම (වයස 60ට වැඩි) නිසා යැපුම් අනුපාතය වැඩිවීම, ඵලදායිතාව අඩුවීම, ඉතුරුම් අනුපාතය අඩුවීම හා සමාජ සුබසාධනය සඳහා රජයේ වියදම් වැඩිවීම වැනි බරපතල ආර්ථික ගැටලු රට තුළ වර්ධනය විය හැකිය. ජනගහනය සාපේක්ෂව වයස්ගත ජනගහනය ඉහළ යාම නිසා ඔවුන්ගේ ලෙඩ රෝග සඳහා සායන පැවැත්වීමට, සාත්තු සේවයට, හෙද සේවයට, ඖෂධ සඳහා රජයට විශාල පිරිවැයක් දැරීමට සිදු වේ.

කාන්තාවන් රැකියා වෙළෙඳපොළ වෙත ආකර්ෂණය කර ගැනීම සඳහා ඔවුන් වැඩි වශයෙන් යෙදවිය හැකි ආයෝජන කලාප කර්මාන්තශාලා ආදිය මෙන්ම විවිධ ස්වයං රැකියා ආදිය ද ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ආර්ථිකය තුළ ඉහළ නැංවිය යුතුය. තවද, ආර්ථිකයට කාන්තාවන්ගෙන්

ඉහළ දායකත්වයක් ලබා ගැනීමට ප්‍රවාහන තත්ත්වය විදුලිය, ජලය වැනි යටිතල පහසුකම් දියුණු කිරීම ද දරුවන් ආරක්ෂිතව රැකබලා ගැනීමේ ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම ද අවශ්‍ය වේ. එමගින් කාන්තාවන්ගේද ශ්‍රම බල සහභාගීත්වය ඉහළ යන අතර ආර්ථිකයට ද ප්‍රභල දායකත්වයක් සපයනු ඇත.

ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පුරුෂ මෙන්ම ස්ත්‍රීන් ද ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබීම සමස්ත ආර්ථිකයේ ප්‍රගමනයට හේතුවන හෙයින් ද අන් සෑම අංශයක දීම මෙම දෙපිරිසම බල ගැන්වීම සිදු කළ යුතුවේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Department of Census and Statistics, S. L. (2020). Sri Lanka Labour Force Survey 1st Quarter - 2020. *Sri Lanka Labour Force Survey 1st Quarter - 2020, 88,* 1–4.

Gunarathna, K.M.L.M.M. (2007). Open Economy in a Tense Situation; Sri Lanka's Experience. International Conference on Sri Lanka Studies. University of Portsmouth. Retrieved on 06th May, 2022 from https://www.researchgate.net/publication/280740126_Open_Economy_in_a_Tense_situation_Sri_Lanka's_Experiences

Garza-rodriguez, J. (2016). *Volume 36 , Issue 1 The relationship between population growth and economic growth in Mexico*. *January*.

Gu, D., Andreev, K., & E. Dupre, M. (2021). Major Trends in Population Growth Around the World. *China CDC Weekly*, *3*(28), 604–613. Revrieved on 22nd April, 2022 from https://doi.org/10.46234/ccdcw 2021.160

Kumarasinghe, P. J., & Wickramasinghe, A. (2018). Population Pyramid And Economic Growth: An Econometric analysis of Sri Lanka. *International Journal of Management Excellence*, *10*(3), 1348. Retrieved on 02nd May, 2022 from https://doi.org/10.17722/ijme. v10i3.427

Statista. (n.d.). *Population of Sri Lanka 1800-2020*. Retrieved on 03rd May, 2022 from https://www.statista.com/statistics/1067091/population-sri-lanka-historical/

Ugwu, U. T. (n.d.). *Population Growth and National Development*.

Vodopivec, M., & Arunatilake, N. K. (2008). The Impact of Population

Aging on the Labor Market: The Case of Sri Lanka. *Ssrn*. Retrieved on 18th December, 2021 from https://doi.org/10.1111/j.0042-7092.2007.00700.x

ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව (2020). ජාතික නිශ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. ජන හා නිවාස සංගණනය (2011). දිස්ත්‍රික්ක අනුව ශ්‍රී ලංකාවේ ජනගහනය, ISBN 978-955-577-781-0